සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020(I)**

**කාලය: පැය 03**

**වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම- 08**

විභාග අංකය
Index No / சுட்டெண்
.......................................

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. ඔබ දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයන් දිරිමත් කිරීමේ අරමුණින් **"නව අපනයන ව්‍යවසායකයින් බිහි කිරීම"** මැයෙන් එක් දින සම්මන්ත්‍රණයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත. ජපාන විදේශ අමාත්‍යාශයේ මූල්‍යමය සහයෝගය මත ක්‍රියාත්මක වන මෙම වැඩසටහන සම්බන්ධීකරණය කිරීමේ වගකීම දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ඔබ වෙත පවරා තිබේ. සම්මන්ත්‍රණයේ වැඩසටහන් න්‍යාය පත්‍ර කෙටුම්පත සති 02 ක් ඇතුළත ඔබ වෙතින් අපේක්ෂා කෙරේ.

    අ. අපේක්ෂිත න්‍යාය පත්‍රය කෙටුම්පත් කරන්න. (ලකුණු 08)

    ආ. ඉහත දැක් වූ න්‍යාය පත්‍රයේ ප්‍රධාන කොටස් තුනක් (03) තෝරාගෙන ඒවා මෙම සහයෝගීතා වැඩසටහනට අදාළ වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

02. රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයේ පවතින ඇතැම් ගැටළු නිසා විවිධ දූෂණ හා අක්‍රමිකතා සිදුවන්නේ යැයි ද, මේ නිසා මහජනතාව වෙත ලබා දිය යුතු සේවාවන් නිසි පරිදි නොලැබෙන්නේ යැයි ද ඇතැම් අවස්ථාවල විවිධ කතිකාවන්හි සඳහන් වේ.

    අ. දැනට ප්‍රසම්පාදන ක්‍රමවේදයේ පවතින බවට ඔබ නිරීක්ෂණය කර ඇති ගැටළු හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 08)

    ආ. එම ගැටළු මගහරවා ගැනීමට ප්‍රසම්පාදන ක්‍රමවේදය සඳහා තොරතුරු තාක්ෂණය මුසු විය යුතු ආකාරය පැහැදිලි කරමින් ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා දැනුවත් කිරීමට තාක්ෂණික යෝජනාවලියක් සකස් කරන්න. (ලකුණු 12)

03. ඔබ සේවය කරන අමාත්‍යාංශයේ අභ්‍යන්තර ධාරිතා සංවර්ධන සැලැස්මට අනුව, සෑම මසකම එක් දිනක් ආයතනයේ ධාරිතා සංවර්ධනය සඳහා භාවිත කළ යුතු වේ. එළඹෙන පුහුණු දිනයේ දී **"රාජ්‍ය අංශයේ වගවීම හා පාරදෘශ්‍යභාවය"** මැයෙන් දේශනයක් සිදු කිරීමට ඔබ වෙත පැවරී ඇත. ඉහත දේශනයේ අන්තර්ගත විය යුතු ප්‍රධාන කරුණු සාකච්ඡා කරන්න. (ලකුණු 20)

04. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති දත්ත අනුව වර්ෂ 2018-2023 කාල සීමාවේදී දළ දේශීය නිෂ්පාදිතය පහත පරිදි වේ (රූප සටහන 01).




*රූප සටහන 01*

මෙලෙස දළ දේශීය නිෂ්පාදිතය අවප්‍රමාණය වීම හමුවේ පැන නැගිය හැකි ගැටළු සැකෙවින් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

05. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති දත්ත අනුව, විදේශ රැකියා සඳහා වර්ෂ 2021-2024 කාල සීමාව තුළ දී ශ්‍රමිකයන්ගේ පිටව යාම පහත පරිදි වේ (රූප සටහන 02).




*රූප සටහන 02*

අ. මෙම දත්ත විශ්ලේෂණය කරමින් ඉදිරියේදී ශ්‍රී ලංකාවේ අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීම සඳහා පවතින අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ආ. ඉහත අභියෝග සඳහා සුදුසු විසඳුම් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. පහත දැක්වෙන මාතෘකා සම්බන්ධයෙන් කෙටි සටහන් ලියන්න.

i. වාර්ෂික අයවැය ලේඛනය

ii වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම

iii. රාජ්‍ය අංශය මාර්ගගත ගෙවීම් සඳහා යොමුවීමේ වැදගත්කම

iv. සමාජ මාධ්‍යයන් හි මතු කෙරෙන රාජ්‍ය මූල්‍ය ගැටළු (ලකුණු 20)

**********************